පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.31 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1909 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. මනුෂ්‍ය ඝාතනයක් - පූඩළුඔය පොලිස් වසම.

2024.12.30 වන දින රාත්‍රී කාලයේ පූඩළුඔය පොලිස් වසමේ ඩන්සිනන්වත්ත ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුට පහරදීම හේතුවෙන් මියගොස් ඇති බවට පූඩළුඔය පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ ඩන්සිනන්වත්ත, පූඩළුඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ඔහුගේ දියණිය, පියා සහ බාල සහෝදරයා සමඟ ඉහත ලිපිනයේ පදිංචිව සිට ඇති අතර තම පියා සහ සහෝදරයා සමඟ ඇති කරගත් ආරවුලකදී ඔවුන් දෙදෙනා විසින් පොලු වලින් සහ ගල් වලින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇත.

අපරාධයට සම්බන්ධ අවුරුදු 46 හා 18 ක් වන පියා සහ පුතා අත්අඩංගුවට ගෙන ඇති අතර පූඩළුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - මදුරන්කුලිය පොලිස් වසම.

2024.12.30 වන දින රාත්‍රී කාලයේ මදුරන්කුලිය පොලිස් වසමේ කඩයාමට්ට ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට මදුරන්කුලිය පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ කඩයාමට්ට, මදුරන්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ඔහුගේ වැඩිමහල් සහෝදරියගේ පුතා ඇතුළු පිරිසක් සමඟ ඇති කරගත් ආරවුලකදී සහෝදරියගේ පුතා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

අපරාධයට සම්බන්ධ වයස අවුරුදු 38 ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර මදුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍යකර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණු දිසා අපරාධ කොට්ඨාසය.

2024.12.14 වන දින මීගොඩ පොලිස් වසමේ නාගහවත්ත ප්‍රදේශයේදී කාර් රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධව මීගොඩ පොලිසිය හා බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය විසින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව මෙම අපරාධය සම්බන්ධයෙන් සැකකරුවන් 07 දෙනෙකු මීට පෙර අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගතකර ඇති අතර, අපරාධය මෙහෙයවා ඇති බවට සැක කරනු ලබන පුද්ගලයෙකු 2024.12.30 වන දින සවස් කාලයේදී නීතිඥවරයෙකු මාර්ගයෙන් බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන මීගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිදුකළ වැඩිදුර විමර්ශනයේදී මීගොඩ පොලිස් වසමේ සිදුවූ වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ සිද්ධීන් දෙකකට සම්බන්ධ වෙඩික්කරු ලෙස ද මෙම සැකකරු කටයුතු කර ඇති බවට ද අනාවරණ වී ඇත.

බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - මහවෙල පොලිස් වසම.

2024.12.30 වන දින උදෑසන කාලයේ මහවෙල පොලිස් වසමේ මොනරවිල ප්‍රදේශයේදී, විදුලි සැර වැදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට මහවෙල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වන මොනරවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු පල්ලෙපොල ප්‍රදේශයේ ඉඩමක ගස් වල අතු කපමින් සිටින අවස්ථාවේදී අධි බලැති විදුලි රැහැනක කපන ලද අත්තක් ගැටීමෙන් මෙම පුද්ගලයාට විදුලි සැර වැදී ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. දිය අනතුරකින් විදේශීය ජාතිකයෙකු බේරා ගැනීම - අහුංගල්ල පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2024.12.30 වන දින සවස් කාලයේ අහුංගල්ල වෙරළ තීරයේ දිය නාමින් සිටි විදේශීය ජාතිකයෙකු දියේ ගසාගෙන යමින් සිටියදී එම ස්ථානයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් වහාම ක්‍රියාත්මක වී ඔහු නිරුපද්‍රිතව බේරා ගෙන ඇත.

**දිය අනතුරින් බේරාගත් පුද්ගලයා වයස අවුරුදු 34 ක් රුසියානු ජාතිකයෙකු වේ.**

අහුංගල්ල පොලිස් ස්ථානයේ පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් පරික්ෂක මනෝජ් ආරියරත්න, පොලිස් කොස්තාපල්වරුන් වන 29896 ලසන්ත සහ 19342 සංගීත් යන නිලධාරීන් විසින් මෙම දිවි බේරා ගැනීම සිදු කර ඇත.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2024.12.30 වන දින දහවල් කාලයේදී පැලියගොඩ පොලිස් වසමේ 90 වත්ත ප්‍රදේශයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන මීගමුව පාර, පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.

2024.12.30 වන දින සවස් කාලයේදී මට්ටක්කුලිය පොලිස් වසමේ මැද පාර ඉන්ධනහල ආසන්නයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.12.30 වන දින උදෑසන කාලයේදී මරදාන පොලිස් වසමේ මස්ජිද් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 160 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන මරදාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.12.30 වන දිනඋදෑසන කාලයේදී කළුතර දකුණ පොලිස් වසමේ බඩු ගබඩා පාර ප්‍රදේශයේදී කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 130 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පයාගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන පයාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධව සිදුකල වැඩිදුර විමර්ශනයේදී පයාගල පොලිස් වසමේදී රාත්‍රී කාලයේ නිවසක් බිඳ දේපල සොරකම් කිරීමේ සිද්ධියකට අවශ්‍ය කරනු ලබන සැකකරුවෙකු බවට අනාවරණය වී ඇති අතර සොරකම් කරන ලද රන් මාලයක්, අත් පලඳනාවක්, කුඩා ප්‍රමාණයේ නිල් පැහැති මැණික් ගලක්, පංචායුධයක් හා සොරකම් කරන ලද රන් භාණ්ඩ උගස් කර ලබා ගන්නා ලද රුපියල් 150,000/= ක මුදලක් පොලිසිය විසින් සොයාගෙන ඇති අතර පයාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇඹිලිපිටිය පොලිස් ස්ථානය.

2024.12.30 වන දින සවස් කාලයේ ඇඹිලිපිටිය පොලිස් වසමේ කාවන්තිස්සපුර ප්‍රදේශයේදී ඇඹිලිපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 46.5 ක් , ගෝඩා ලීටර් 885 ක්, බැරල් 07 ක්,තඹ දඟර 02 ක්, ගෑස් සිලින්ඩර් 02** ක් සහ **ගෑස් ලිප් 02** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කාවන්තිස්සපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.

2024.12.30 වන දින උදෑසන කාලයේ රාගම පොලිස් වසමේ හීන්කෙන්ද ප්‍රදේශයේදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 135** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන හීන්කෙන්ද, රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර.

2024.12.30 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පරන්තන් සිට මුලතිව් දෙසට ධාවනය කරමින් තිබූ කාර් රථයක් පුදුකුඩිඉරිප්පු පොලිස් වසමේ තේරාවිල් ප්‍රදේශයේදී නවතා පරීක්ෂා කිරීමේදී කාර් රථයේ සූක්ෂම ලෙස සඟවා ප්‍රවාහනය කරමින් තිබූ කේරළ ගංජා කිලෝ 06 ග්‍රෑම් 30 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුදුකුඩිඉරිප්පු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ ඉරණපලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුදුකුඩිඉරිප්පු පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

## 13. ව්‍යාජ මුදල් නෝට්ටුවක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පාදුක්ක පොලිස් ස්ථානය.

2024.12.30 වන දින සවස් කාලයේදී පාදුක්ක පොලිස් වසමේ පාදුක්ක නගරයේ දී පාදුක්ක පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ව්‍යාජ රුපියල් 5000/= මුදල් නෝට්ටුවක් සමඟ** සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන හැටන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පාදුක්ක නගරයේ රටබීම හලකදී ව්‍යාජ මුදල් රුපියල් 5000/- නෝට්ටුවක් ලබාදී මත්පැන් මිලට ගැනීමට උත්සාහ කළ පුද්ගලයෙකු සම්බන්ධව එම රටබීම හලේ කළමණාකරුට ඇතිවූ සැකය මත පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් පසු සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

පාදුක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - දෙයියන්දර පොලිස් වසම.

2024.12.30 වන දින සවස් කාලයේ දෙයියන්දර පොලිස් වසමේ හක්මණ මුලටියන මාර්ගයේ පල්ලාවල විදුහල ආසන්නයේදී දෙයියන්දර දෙස සිට හක්මණ දෙසට ධාවනය වූ බස් රථයක් ඉදිරියෙන් පැමිණි යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බස් රථයේ ඉදිරි දකුණු පස රෝදයට යටවී බරපතල තුවාල ලබා දෙයියන්දර රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ ගොම්බද්දල, මාතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. දෙයියන්දර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - ගලේවෙල පොලිස් වසම.

2024.12.30 වන දින රාත්‍රී කාලයේ ගලේවෙල පොලිස් වසමේ අඹේපුස්ස ත්‍රිකුණාමලය මාර්ගයේ තලකිරියාගම ප්‍රදේශයේදී දඹුල්ල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ යතුරු පැදියක් ඉදිරියෙන් එම දිශාවටම ධාවනය වූ ලොරි රථයක පසුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු හා පසුපැදිකරු තුවාල ලබා දඹුල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ දේවහුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - නාල්ල පොලිස් වසම.

2024.12.30 වන දින රාත්‍රී කාලයේ නාල්ල පොලිස් වසමේ මීරිගම ගිරිඋල්ල මාර්ගයේ ලෝලුවාගොඩ ප්‍රදේශයේදී මීරිගම දෙස සිට ගිරිඋල්ල දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය අයිනේ ගමන් කරමින් සිටි පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා සහ යතුරු පැදිකරු මීරිගම රෝහලට ඇතුලත් කර ප්‍රථිකාර ලබමින් සිටියදී පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ ලෝලුවාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මිරිගම රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. නාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 17. මාරක රිය අනතුරක් - පේරාදෙණිය පොලිස් වසම.

2024.12.30 වන දින රාත්‍රී කාලයේ පේරාදෙණිය පොලිස් වසමේ එළගොඩ පමුණුව මාර්ගයේ දොඩම්වලපිටිය ප්‍රදේශයේදී එළගොඩ දෙස සිට පමුණුව දෙසට ධාවනය වූ වෑන් රථයක් ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු හා පසුපැදිකාරිය තුවාල ලබා පේරාදෙණිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකරු මියගොස් ඇත. පසුපැදිකාරිය වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ පේරාදෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පේරාදෙණිය රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. පේරාදෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**